# ප්‍රසම්පාදන දැන්වීමයි.

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## මහ රෝහල (ශික්ෂණ), පේරාදෙණිය

## ඉවතලන ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් කැඳවීම 2025/2026

සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, මහ රෝහල(ශික්ෂණ), පේරාදෙණිය විසින් 2025.10.01 දින සිට 2026.03.31 දින දක්වා වූ කාලය තුල රෝහලෙහි එක් රැස් වෙන පහත සඳහන් ඉවතලන ද්‍රව්‍ය ඉවත්කර ගැනීම සඳහා 2025 ඔත්තොබර් මස 10 දින සිට ඔත්තොබර් මස 24 දින දක්වා මුද්‍රා තැබූ මිළ ගණන් කැඳවනු ලැබේ.

| | ඉවතලන ද්‍රව්‍යය | දළ වශයෙන් එක්රැස් විය හැකි ප්‍රමාණය |
|---|---|---|
| 1 | ඉවතලන වීදුරු බෝතල් | කි. ග්‍රෑ 7,500 |
| 2 | ඉවතලන හිස් සේලයින් බෝතල් (පිරිසිදු නොකල) | කි. ග්‍රෑ 2,000 |
| 3 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 10 | කෑන් 2,500 |
| 4 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 05 | කෑන් 3,000 |
| 5 | ඉවතලන පොල්කටු | කි. ග්‍රෑ 3,500 |
| 6 | කාඩ් බෝඩ් | කි. ග්‍රෑ 4,000 |
| 7 | ඉවතලන හිස් ප්ලාස්ටික් බෝතල් (ඖෂධ බහාලන ලද) | කි. ග්‍රෑ 750 |

01 මිල ගණන් යොමුකිරීමේදී මෙම ලංසු ලේඛණය සම්පූර්ණ කර, එම ලංසු බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙලවරෙහි **"ඉවතලන ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම 2025/2026"** ලෙස සඳහන් කර **2025.10.24 දින පෙ.ව 10.30** ට පෙර **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, මහ රෝහල, පේරාදෙණිය** යන ලිපිනයට යොමුකිරීමට හෝ රෝහල් ගණකාධිකාරී කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැම්පත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

02 ලංසු ලේඛණ රෝහල් සරප් අංශය වෙත රු.500.00 ක මුදල් ගෙවා එම ලද ලදු පත ගිණුම් අංශය වෙත ඉදිරිපත්කර ලබා ගත හැකිය

03 අදාල මිල ගණන් 2025.10. 24 දින පෙ.ව 10.30 ට රෝහල් ශ්‍රවණාගාරෙය්දී විවෘත කිරීමට නියමිත අතර ඒ සඳහා ඔබ හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගීවීමට ඉඩ දෙනු ලැබේ.

04 මෙම මිල ගණන් 2026.03.31 දින දක්වා රෝහල තුල එක් රැස්වන තොගයන් සඳහා පමණක් වලංගු වේ.

05 ලංසු ලේඛණයෙහි සඳහන් අවම ලංසු මුදලට වඩා වැඩි මිල ගණන් ඉදිරිපත් කල යුතු වන අතර එසේ ඉදිරිපත් නොවන මිල ගණන් ප්‍රතික්ෂේප කරණු ලැබේ.

06 එක් එක් අයිතමයක් සඳහා ඔබ විසින් ඉදිරිපත්කරණු ලබන මිල ගණන් ලංසු අයදුම් පත්‍රයෙහි අංක 09 යටතේ දක්වා ඇති වගුවෙහි **"ඒකකයක මිල"** තීරුවෙහි සඳහන් කල යුතුය.

07 ලංසු කරුවන් අංක 15 යටතේ එක් එක් අයිතමයන් ඉදිරියෙන් දක්වා ඇති වටිනාකමැති නැවත ගෙවනු ලබන ලංසු ඇපකර රෝහල් සරප් අංශය වෙත ගෙවා එම ලදු පත්වල පිටපත් ලංසු ලේඛණ සමග ඉදිරිපත් කල යුතුය.

08 ලංසු ඇපකර සහ කාර්ය සාධන ඇපකර ඉදිරිපත් නොකරන ලංසුකරුවන් සුදුසකම් නොලබන ලංසුකරුවන්/ ගැනුම්කරුවන් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

09 ලංසු ඇපකර සහ කාර්ය සාධන ඇපකර නැවත ලබා ගැනීම සඳහා ලදු පත් වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතු බැවින් ඒවා ආරක්ෂිතව තබා ගැනීම ලංසුකරුවන්ගේ වගකීම වේ.

10 ඉහත සඳහන් කොන්දේසි හා නියමයන් කඩ නොකිරීමට වගබලා ගත යුතු අතර එසේ කඩ කරණු ලබන අවස්ථාවකදී මෙම ලිපිය මගින් ඉවතලන ද්‍රව්‍ය ඉවත් කර ගැනීම සඳහා ඔබ වෙත ලබාදී ඇති අනුමැතිය අවලංගු කිරීමට සහ ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලින් ඉවත්කිරීමට කටයුතු කරණු ලැබේ.

11 මෙම ප්‍රසම්පාදනය සඳහා රෝහල් කාර්ය මණ්ඩලයේ කිසිවකුට ඉදිරිපත් විය නොහැක

12 මෙය සාධාරණ හේතුන් මත අවලංගුකිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලය රෝහල් පරිපාලනය හෝ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**13** නැවත ගෙවනු ලබන ලංසු ඇපකර තොරතුරු

| | ඉවතලන ද්‍රව්‍යය | නැවත ගෙවනු ලබන මුදල් ඇපකරය රු. |
|---|---|---|
| 1 | ඉවතලන වීදුරු බෝතල් | 5,000.00 |
| 2 | ඉවතලන හිස් සේලයින් බෝතල් (පිරිසිදු නොකල) | 5,000.00 |
| 3 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 10 | 10,000.00 |
| 4 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 05 | 5,000.00 |
| 5 | ඉවතලන පොල්කටු | 5,000.00 |
| 6 | කාඩ් බෝඩ් | 5,000.00 |
| 7 | ඉවතලන හිස් ප්ලාස්ටික් බෝතල් (ඖෂධ බහාලන ලද) | 5,000.00 |

**14** දළ වශයෙන් එක්රැස් විය හැකි ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු **(2025.03.31** දිනට**)**

| | ඉවතලන ද්‍රව්‍යය | දළ වශයෙන් එක්රැස් විය හැකි ප්‍රමාණය |
|---|---|---|
| 1 | ඉවතලන වීදුරු බෝතල් | කි. ග්‍රෑ 7,500 |
| 2 | ඉවතලන හිස් සේලයින් බෝතල් (පිරිසිදු නොකල) | කි. ග්‍රෑ 2,000 |
| 3 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 10 | කෑන් 2,500 |
| 4 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 05 | කෑන් 3,000 |
| 5 | ඉවතලන පොල්කටු | කි. ග්‍රෑ 3,500 |
| 6 | කාඩ් බෝඩ් | කි. ග්‍රෑ 4,000 |
| 7 | ඉවතලන හිස් ප්ලාස්ටික් බෝතල් (ඖෂධ බහාලන ලද) | කි. ග්‍රෑ 750 |

**15** නැවත ගෙවනු ලබන කාර්ය සාධන ඇපකර තොරතුරු

| | ඉවතලන ද්‍රව්‍යය | නැවත ගෙවනු ලබන කාර්ය සාධන ඇපකරය රු. |
|---|---|---|
| 1 | ඉවතලන වීදුරු බෝතල් | 5,000.00 |
| 2 | ඉවතලන හිස් සේලයින් බෝතල් (පිරිසිදු නොකල) | 25,000.00 |
| 3 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 10 | 25,000.00 |
| 4 | ඉවතලන හිස් ප්ලාස්ටික් කෑන් ලීටර් 05 | 25,000.00 |
| 5 | ඉවතලන පොල්කටු | 15,000.00 |
| 6 | කාඩ් බෝඩ් | 20,000.00 |
| 7 | ඉවතලන හිස් ප්ලාස්ටික් බෝතල් (ඖෂධ බහාලන ලද) | 10,000.00 |

**ලංසු ප්‍රදානය කිරීම :-**

1. ඉහළම මිල ගණන් ඉදිරිපත්කරනු ලබන ලංසුකරුවන් ගැනුම්කරුවන් වශයෙන් තොරාගනු ලබන අතර එම ලංසුකරුවන් **නැවත ගෙවනු ලබන කාර්ය සාධන ඇපකරය නිමිත දිනට ලබාදීමට කටයුතු නොකිරීම හෝ වෙනත් හේතුන් මත නුසුදුස්සෙකු ලෙස සලකා කටයුතු කරන ලද අවස්තාවකදී ඊ ලඟ** ඉහළම මිල ගණන් ඉදිරිපත්කරනු ලබන ලංසුකරුවන් ගැනුම්කරුවන් වශයෙන් තොරාගනු ලැබේ.

2. ඉහළම මිල ගණන් ලංසුකරුවන් කිහිප දෙනෙකු විසින් ඉදිරිපත්කර ඇති අවස්තාවකදී අදාල ද්‍රව්‍ය සම ලෙස බෙදී යන පරිදි දින ගණන් වෙන්කර දෙනු ලැබේ.

3. එම ද්‍රව්‍ය දින 15 කට වරක් හෝ රෝහල විසින් දන්වන ඕනෑම අවස්ථාවක එම දැනුම් දීමෙන් දින 03 ක් තුල අදාල ද්‍රව්‍ය රෝහලින් ඉවත් කර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ නොවුනහොත් විකිණීමේ නියෝග අවලංගුකර වෙනත් ලංසුකරුවෙකු වෙත ලබාදීමටත් ඉහත සඳහන් ඇපකරය දැනුම් දීමකින් තොරව රජයේ ආදායමට බැර කිරීමටත් කටයුතු කරණු ලැබේ.

4. අදාළ මුදල් රෝහල වෙත ගෙවීමෙන් අනතුරුව ඉවත් කරගත යුතුය. එමෙන්ම එම භාණ්ඩ එක්රැස් කර තබන ගබඩා එම භාණ්ඩ ඉවත් කරගැනීමෙන් අනතුරුව පෙර තිබූ පරිදි පිරිසිදු කළ යුතුය. එමෙන්ම එම ගබඩා වල ඇති විදුලි සහ වෙනත් උපකරණ වලට හානි වන අන්දමින් ක්‍රියා කළ හොත් අදාළ අලාබය ලංසුකරුගෙන් අයකර ගැනිමට කටයුතු කරනු ලැබේ.

5. රෝහල් භූමිය තුළ අදාළ භාණ්ඩ ඉවත් කරගන්නා විට රෝගී සත්කාර කටයුතු වලට බාධා නොවන අයුරින් කටයුතු කළ යුතුය.

6. මෙම ඉවතලන ද්‍රව්‍ය නියමිත ඒකකයන්ගෙන් මිණුම්කර බලා නියම කරණු ලබන මුදල රෝහල් සරප් අංශයට ගෙවීමෙන් පසු අදාල කුවිතාන්සිය ඉදිරිපත්කර ගේට්ටු අවසර පත්‍රයක් ලබාගෙන එම ද්‍රව්‍ය රෝහලින් ඉවත්කර ගත යුතු අතර එම ගේට්ටු අවසර පත්‍රය පිටවීමේ ගේට්ටුවේ සේවය කරන ආරක්ෂක නිලධාරි වෙත ඉදිරිපත් කර රෝහල් භූමියෙන් පිටවිය යුතුය.

7. හොඳින් ආවරණය කරන ලද රථ වල (භාණ්ඩ හා ද්‍රව්‍ය අවට නොවිසිරෙන පරිදි) ප්‍රවාහනය කළ යුතුය.

8. මෙම භාණ්ඩ රැගෙන යාමෙන් පසුව අවට පදිංචිකරුවන්ට හා ව්‍යාපාරයන්ට අපහසුතාවයක් නොවන පරිදි සහ පැමිණිලි ඉදිරිපත් නොවන පරිදි තම ව්‍යාපාර කටයුතු සිදු කළ යුතුය.(පරිසරයට හානි නොවන පරිදි)

9. රෝහලෙන් අදාළ භාණ්ඩ සහ ද්‍රව්‍ය වල මිනුම් කටයුතු අවසන්කර භාර දුන් පසුව එම භාණ්ඩවල සම්පූර්ණ වගකීම කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුය.
10. මෙම භාණ්ඩ ප්‍රවාහනය සහ පැටවීම සඳහා අවශ්‍ය සේවකයන් සහ වාහන කොන්ත්‍රාත් කරු සපයාගත යුතුය.
11. අපද්‍රව්‍ය බැහැරලීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය පනවා ඇති නීති රීති වලට පටහැනි නොවන පරිදි ක්‍රියා කළ යුකුය. යම් හෙයකින් එවැනි වැරදි ඔබ විසින් සිදු කළ හොත් ඒ සඳහා රෝහල විසින් වග කියනු නොලබන අතර, එවැනි සිදුවීමකදී සියළුම කරුණු වලට ඔබ විසින් වගකිව යුතු වේ.

12. ගැණුම්කරුවන් ලෙස තෝරා ගනු ලබන ලංසුකරුවන් විසින් අංක 15 යටතේ එක් එක් අයිතමයන් ඉදිරියෙන් දක්වා ඇති වටිනාකමැති හා 2026.04.28 දින දක්වා වලංගු වන නැවත ගෙවනු ලබන කාර්ය සාධන ඇපකරයක් රෝහල් සරප් අංශය වෙත ගෙවා එම ලදු පත ඉවතලන ද්‍රව්‍ය ඉවත්කර ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන දින සිට දින 07ක් ඇතුලත අදාල විෂය නිලධාරී වෙත ඉදිරිපත් කල යුතුය.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
මහ රෝහල ( ශික්ෂණ),
පේරාදෙණිය.